# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1982 අංක 18 දරන කොළඹ සහිරා විද්‍යාලයේ පාලක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 මැයි මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1982 මැයි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිළ: ශත 65 යි　　තැපැල් ගාස්තුව: ශත 50 යි

# 1982 අංක 18 දරන කොළඹ සහිරා විද්‍යාලයේ පාලක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1982 මැයි මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 29/81.

**කොළඹ සහිරා විද්‍යාලයේ පාලක මණ්ඩලය සංස්ථාගත කිරීම පිණිස සහ ඒ කාර්යය සඳහා මරදානේ මුස්ලිම් පල්ලි ආඥාපනත සංශෝධනය කිරීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

කොළඹ, සහිරා විද්‍යාලය යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන පාසලක් මේ දක්වා කොළඹ, මරදානේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී පාසැලේ සාමාන්‍ය පාලනය හා විධානය මෙතෙක් කල් මරදානේ මුස්ලිම් පල්ලි ආඥාපනතේ භාරකාර මණ්ඩලය වෙත පවරා තිබූ හෙයින් ද:

එකී පාසැලේ සාමාන්‍ය පාලනය හා විධානය වෙනම පාලක මණ්ඩලයක් වෙත පැවරීම සහ එවැනි මණ්ඩලයක් නීත්‍යනුකූලව සංස්ථාගත කරනු ලැබීම අවශ්‍යාපේක්ෂිත යයි එකී භාරකාර මණ්ඩලය විසින් දැනට සලකනු ලැබීම සහ ඊට මනාපය පළ කිරීම කර ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1982 අංක 18 දරන කොළඹ සහිරා විද්‍යාලයේ පාලක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) (මේ පනතෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කොළඹ, සහිරා විද්‍යාලය සඳහා, මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන්, පාලක මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. කොළඹ සහිරා විද්‍යාලය සඳහා පාලක මණ්ඩලයක් පිහිටුවීම.

(2) ඒ මණ්ඩලය "කොළඹ සහිරා විද්‍යාලයේ පාලක මණ්ඩලය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, එය විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකි වන්නේ ය. තව ද පොදු මුද්‍රාවක් පාවිච්චි කිරීමට ද මණ්ඩලයේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට ද සම්පූර්ණ බලය සහ අධිකාරය එයට ඇත්තේ ය.

3. (1) මණ්ඩලය පහත සඳහන් පරිදි සංස්ථාපිත සාමාජිකයන් දහ අට දෙනකුගෙන් සමන්විත විය යුතු ය:— මණ්ඩලයේ සංයුතිය.

(අ) මරදාන මුස්ලිම් පල්ලියේ විධායක කමිටුවේ සභාපතිවරයා සහ එම විධායක කමිටුව විසින් සිය සාමාජික සංඛ්‍යාව අතුරෙන් තෝරා පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් සතර දෙනෙක් ;

(ආ) කොළඹ සහිරා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා සහ තත් කාර්යය සඳහා විශේෂයෙන් කැඳවනු ලැබූ මහා සභා රැස්වීමක දී පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගේ ඡන්දවල බහුතර සංඛ්‍යාවෙන් එම සහිරා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් සිය සාමාජික සංඛ්‍යාව අතුරෙන් තෝරා පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් තිදෙනෙක් ;

(ඇ) කොළඹ සහිරා විද්‍යාලයේ සුභසාධක සමිතිය විසින් තත් කාර්යය සඳහා විශේෂයෙන් රැස් කරවනු ලැබූ මහා සභා රැස්වීමක දී පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගේ ඡන්දවල බහුතරයක් මගින් සිය සාමාජික සංඛ්‍යාව අතුරෙන් තෝරා පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක් ;

(ඈ) කොළඹ සහිරා විද්‍යාලයේ ගුරු-දෙගුරු සංගමය විසින් තත් කාර්යය සඳහා විශේෂයෙන් රැස් කරවනු ලැබූ මහා සභා රැස්වීමක දී පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගේ ඡන්දවල බහුතරයක් මගින් සිය සාමාජික සංඛ්‍යාව අතුරෙන් තෝරා පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක් : එසේ වුව ද, කිසිම ගුරුවරයකු මෙසේ තෝරා පත් කරනු නොලැබිය යුතු ය ; තවද

(ඉ) මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින් තවදුරටත් තෝරා ගනු ලැබිය යුතු සාමාජිකයන් තිදෙනෙක්.

(2) මරදාන මුස්ලිම් පල්ලියේ විධායක කමිටුවේ සභාපතිවරයා සහ කොළඹ සහිරා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා, ඒ සභාපතිවරයන් ලෙස ධුරය දරන තාක් කල් මණ්ඩලයේ සාමාජිකයන් ලෙස ධුරය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් සාමාජිකයකු—

(අ) මිය යාම නිසා ;

(ආ) මණ්ඩලයෙන් හෝ මණ්ඩලයේ ඔහු විසින් නියෝජනය කරනු ලබන සංවිධානයෙන් ඉල්ලා අස්වීම නිසා ; හෝ

(ඇ) මණ්ඩලයේ ඔහු විසින් නියෝජනය කරනු ලබන සංවිධානය විසින් ඉවත් කරනු ලැබීම නිසා

කලින් ධුරය හිස් කරතහොත් මිස, මණ්ඩලයේ අනෙක් සාමාජිකයන් අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, එවැනි පුරප්පාඩුවක් අදාළ සංවිධානය විසින් තෝරා පත් කර ගනු ලබන්නා වූ හෝ කැමැත්තෙන් පත් කරනු ලබන්නා වූ වෙනත් සාමාජිකයකු මගින් පුරවනු ලැබිය යුතු ය. තව ද ඒ සාමාජිකයා, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ සේවය කිරීම සඳහා, යම් වේලාවක උචිත සංවිධානය විසින් යම් නියෝජිතයකු තෝරා පත් කිරීමට නොහැකිවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) හෝ

(ඈ) ඡේදවල සඳහන් සංවිධාන අතුරෙන් යම් සංවිධානයක් නියෝජනය කර නොමැති අවස්ථාවක, මණ්ඩලයේ ඉතිරි සාමාජිකයන් විසින්, උචිත සංවිධානයේ සාමාජිකයන් අතුරෙන් නියෝජිතයකු තෝරා ගනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සේවය කිරීම සඳහා උචිත සංවිධානය විසින් නියෝජිතයකු තෝරා පත් කර ගනු ලබන ඒ වේලාව තෙක්, එසේ තෝරා ගනු ලැබූ යම් සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ධුර දැරිය යුතු ය.

(4) මෙම පනත ආරම්භවීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙම මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන තුරු කොළඹ සහිරා විද්‍යාලයට අදාළ සහ ඒ හා සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් මේ පනත යටතේ මණ්ඩලයේ සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු වූ පහත සඳහන් තැනැත්තන්ගෙන් මෙම මණ්ඩලය සංස්ථාපනය විය යුතු ය:—

(1) අල්හාජ් වෛද්‍ය එම්. සී. එම්. කලීල්,

(2) පාර්ලිමේන්තු මන්ත්‍රී අල්හාජ් ජබීර් ඒ. කාදර්,

(3) රාජ නීතිඥ ඒ. සී. එම්. අමීර්,

(4) පාර්ලිමේන්තු මන්ත්‍රී අල්හාජ් එම්. එච්. එම්. නයිනා මරික්කාර්,

(5) පාර්ලිමේන්තු මන්ත්‍රී අල්හාජ් ගරු එම්. ඒ. බාකීර් මාකාර්,

(6) අල්හාජ් ඒ. රහමන් එම්. හාති,

(7) ටී. ඒ. ජයා මහතා,

(8) එම්. ටී. ඒ. ෆුර්කාන් මහතා,

(9) හුසේන් හමීම් මහතා,

(10) අල්හාජ් රාෆි ඒ. කපූර්,

(11) අල්හාජ් එම්. මොහිදීන් කසීම්.

(5) (4) වන උපවගන්තිය යටතේ සංස්ථාපිත මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම සිදුවූ විටක, එම පුරප්පාඩුව මණ්ඩලය විසින් පිරවිය යුතු ය.

(6) (මෙහි මින්මතු "අමාත්‍යාංශයේ ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, (4) වන උපවගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන මෙම මණ්ඩලය වෙත සති දෙකකට නොඅඩු දැනුම්දීමක් මගින් මෙම පනත ආරම්භ වන දින සිට එක් මාසයක් ඇතුළත මෙම මණ්ඩලයේ ප්‍රථම සභා රැස්වීම කැඳවනු ලැබිය යුතු ය.

(7) (4) වන උපවගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන මණ්ඩලයේ ප්‍රථම සභා රැස්වීමේ මූලාසනය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් දැරිය යුතු අතර, ඔහු විසින් ඒ සභා රැස්වීමේ දී එම මණ්ඩලය විසින් සිය සාමාජික සංඛ්‍යාව අතුරෙන් සභාපතිවරයකු, ලේකම්වරයකු හා භාණ්ඩාගාරිකවරයකු තෝරා පත් කරනු ලැබීමට සැලැස්විය යුතු ය. ඊට පසුව, (1) වන උපවගන්තිය යටතේ වූ

මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන තුරු, මෙම මණ්ඩලය විසින් එක් මසකට නොවැඩි කාලාන්තරයක් අතර සභා රැස්වීම් පැවැත්විය යුතු ය.

(8) (4) වන උපවගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන මණ්ඩලයේ යම් සභා රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(9) පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතරයක් මගින් ගනු ලබන තීරණයක් (4) වන උපවගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන මණ්ඩලයේ තීරණය වශයෙන් සලකනු ලැබිය යුතු ය. මණ්ඩලයේ පවතින්නා වූ යම් පුරප්පාඩුවක් නිසා මණ්ඩලය විසින් කරනු ලැබූ යම් ක්‍රියාවක විලංගුභාවයට බලපෑමක් ඇති නොවිය යුතු ය.

(10) (4) වන උපවගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන මණ්ඩලය විසින්, එහි ප්‍රථම සභා රැස්වීමෙන් එක් මාසයක් ඇතුළත එහි කටයුතු පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන යම් රීති සෑදිය යුතු ය.

(11) අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මෙම පනත ආරම්භවීමේ දින සිට වර්ෂ දෙකක කාලයක් ඇතුළත (1) වන උපවගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන මණ්ඩලයේ ප්‍රථම සභා රැස්වීම කැඳවනු ලැබිය යුතු ය.

(12) (6) සිට (10) දක්වා වූ උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (1) වන උපවගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන මණ්ඩලයට අදාළ විය යුතු ය.

දේපළ මණ්ඩලය වෙත පැවරීම සහ 347 වන අධිකාරය සංශෝධනය කිරීම.

4. (1) මෙම පනත ආරම්භවීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි, කොළඹ, සහිරා විද්‍යාලයේ සාමාන්‍ය පාලනය හා විධානය සඳහා මරදාන මුස්ලිම් පල්ලියේ භාරකාර මණ්ඩලය විසින් භාරයෙන දරනු ලැබිය යුතු පරිදි සියලු චංචල හා නිශ්චල දේපළ, අලුත් කිරීමේ මනාපය සහිතව අවුරුදු තිහක කාලයක් සඳහා එකී මරදාන මුස්ලිම් පල්ලියේ භාරකාර මණ්ඩලය විසින් එම මණ්ඩලය වෙත බද්දු දෙනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(2) මරදානේ මුස්ලිම් පල්ලි ආඥාපනතේ 7 වන වගන්තියේ (2) වන උපවගන්තිය සහිරා විද්‍යාලයේ සාමාන්‍ය පාලනය සහ විධානය සම්බන්ධයෙන් අදාළ වන තාක් දුරට, එය මෙයින් ඉවත් කරනු ලැබේ.

(3) කොළඹ, සහිරා විද්‍යාලයේ පාලනයට හා විධානයට සම්බන්ධ සියලු අයිතිවාසිකම්, බලතල හා කාර්ය සහ කොළඹ, සහිරා විද්‍යාලය පරිපාලනය කිරීම, පවත්වා ගෙන යාම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් මරදාන මුස්ලිම් පල්ලියේ භාරකාර මණ්ඩලය විසින් දරනු ලැබූ ඒ මණ්ඩලයේ සියලු ණය, වගකීම් හා බැඳීම්, මෙම පනත ආරම්භ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෙම මණ්ඩලය වෙත සතු කොට පවරා දිය යුතු ය.

*මණ්ඩලය, කොළඹ සහිරා විද්‍යාලයේ හිමිකරු ලෙස සැලකිය යුතු බව.*

**5.** මණ්ඩලය, කොළඹ සහිරා විද්‍යාලයේ හිමිකරු ලෙස සලකනු ලැබිය යුතු අතර, 4 (1) වන වගන්තියේ සඳහන් සියලු දේපළවල සහ කොළඹ, සහිරා විද්‍යාලය පරිපාලනය කිරීමේ, පවත්වාගෙන යාමේ හා නඩත්තු කිරීමේ කාර්යය සඳහා කවර වූ හෝ තැනැත්තන්ගෙන් ලැබෙන යා ගිණුමෙහි දරන්නා වූ මුදල් ඇතුළුව වෙනත් සියලු දේපළ මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතු ය.

*මණ්ඩලයේ බලතල.*

**6.** මෙම පනතට හා වෙනත් යම් නීතියකට යටත්ව, මණ්ඩලයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :—

(අ) අධ්‍යාපනික ආයතනයක් වශයෙන් කොළඹ, සහිරා විද්‍යාලයේ සියලු කටයුතු කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම, පවත්වාගෙන යාම හා පාලනය කිරීම ;

(ආ) විද්‍යාලයාධිපතිවරයා, නියෝජ්‍ය විද්‍යාලයාධිපතිවරයා, උප විද්‍යාලයාධිපතිවරයන්, ගුරු මණ්ඩලයේ සාමාජිකයන්, සේවකයන් හෝ වෙනත් සේවා නියුක්තයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම හා පහ කිරීම ;

(ඇ) යම් චංචල හෝ නිශ්චල දේපළක්, ත්‍යාගයක්, ඊක්ෂෙවර්ණ යක්, අන්තිම කැමති පත්‍රයක් හෝ ප්‍රදානයක් මගින් අත්කර ගැනීම, මිලට ගැනීම, තබා ගැනීම හෝ භාර ගැනීම ;

(ඈ) මණ්ඩලයට අයත් යම් දේපළක් විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඉ) මණ්ඩලයේ යම් අරමුදල් ආයෝජනය කිරීම, ණය එකතු කිරීම හා මුදල් ණයට ගැනීම ; සහ

(ඊ) කොළඹ, සහිරා විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යාමෙහි ලා මණ්ඩලය විසින් ස්වකීය කර්තව්‍ය හා කාර්ය නිසි පරිදි ඉටු කිරීම සඳහා මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි හෝ නියමිත වූ ද, මෙම පනතට හෝ වෙනත් යම් නීතියකට අනනුකූල නොවන්නා වූ ද රීති සෑදීම සහ එසේ සාදනු ලැබූ විට, ඒ රීති වෙනස් කිරීම, සංශෝධනය කිරීම, එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම.

*මණ්ඩලයේ මුද්‍රාව.*

**7.** තත්කාර්යය සඳහා මණ්ඩලය විසින් විධිමත් ලෙස බලය පවරනු ලබන මණ්ඩලයේ යටත් පිරිසෙයින් සාමාජිකයන් තිදෙනකුවත් ඉදිරිපිට දී මිස මණ්ඩලයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නො ලැබිය යුතු ය. එකී සාමාජිකයන් තිදෙනා පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

*සහිරා විද්‍යාලයේ සාමාන්‍ය ශුභ සාධනය.*

**8.** මේ පනතින් විධිවිධාන සලස්වනු ලැබ නොමැති සියලු අවස්ථාවල දී, මණ්ඩලය විසින් යම් නීතියකට යටත්ව, කොළඹ සහිරා විද්‍යාලයේ ශුභ සාධනය සැලසීම සඳහා බෙහෙවින් ඉවහල් වන ලෙස එයට පෙනෙන, අවශ්‍ය සියලු ක්‍රියා කරනු ලැබීම සහ සියලු පියවර ගනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

3—ඒ 42611—12,600 79/07)

(කොළඹ) සහිරා විද්‍යාලයීය අරමුදල

**9.** (1) මණ්ඩලය විසින්, මේ පනතෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන, "(කොළඹ) සහිරා විද්‍යාලයීය අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලක් පිහිටුවිය යුතු ය.

(2) කොළඹ සහිරා විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා සහ ඒ වෙනුවෙන් හා ඒ කාර්ය සඳහා ත්‍යාගයක, රික්ථවරණයක, අන්තිම කැමති පත්‍රයක, පරිත්‍යාගයක, දායක මුදලක, සම්මාදමක, ගාස්තු හෝ ප්‍රදානයන් මාර්ගයෙන් යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් මීට පෙර භාර ගනු ලැබූ හෝ මින්මතු භාරගනු ලබන සියලු මුදල් සම්බන්ධයෙන් ගිණුම් තබා මණ්ඩලයට පැවරිය යුතු අතර, මණ්ඩලය විසින් ඒ සියලු මුදල් අරමුදලට බැර කොට මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු පරිදි, එක බැංකුවක හෝ ඊට වැඩි ගණනක තැන්පත් කළ යුතු ය.

(3) කොළඹ, සහිරා විද්‍යාලයේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මණ්ඩලයේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු වියදම් අරමුදලින් ගෙවිය යුතු ය.

347 වන අධිකාරයට වඩා මේ පනතට ප්‍රමුඛත්වය ලැබිය යුතු බව.

**10.** මරදාන මුස්ලිම් පල්ලි ආඥාපනතේ කුමක් සඳහන් ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර ඒ අනුව මේ පනතේ විධිවිධාන හා ඒ ආඥාපනතේ විධිවිධාන හා අතර යම් ගැටීමක් හෝ නොගැළපීමක් ඇතිවන අවස්ථාවක මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙනින් ඔවුන්ගේ මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාගත මණ්ඩලයක හෝ වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නො විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.